# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date } 22/5/18

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | එම්.කේ.කේ. පෙරේරා මයා.<br>නො 1/4 සී. හීන්පැන්දල පාර.<br>ඔසනගොඩ - ගාල්ල. |
| වගඋත්තරකාර පාර්ශවය | : | විදුහල්පති.<br>රිච්මන්ඩ් විද්‍යාලය.<br>ගාල්ල. |

<u>පැමිණිලි අංකය :- HRC/MT/04/20/N</u>

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :-**

පෙත්සම්කාර පාර්ශවය වන එම්.කේ.කේ. පෙරේරා මයා විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පෙත්සම ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ එම්.ජ්.ආර්. පෙරේරා වන තම දරුවා 2020 වර්ෂයේ ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා 29/2019 චක්‍රලේඛයෙහි 7.5 වගන්තිය ප්‍රකාරව රජයේ පාසල් අධ්‍යයනයට සෘජුවම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ ළමුන් යන ගණය යටතේ ඉල්ලුම් පත්‍ර යොමු කර ඇති අතර ED 55 යන අංකය යටතේ දරුවා ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයෙහි පැවති සම්මුඛ පරීක්ෂණය වෙත සහභාගි වී ඇත.

ඉහත සඳහන් සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂණ මණ්ඩලය විසින් පෙත්සම්කරුගේ දුෂ්කර සේවා කාලය සනාථ කර ගැනීම පිළිබඳ මතුව තිබූ ගැටළුව පදනම් කරගෙන ලකුණු ලබාදීම තාවකාලිකව අත්හිටුවා ඇත. තවද, පළමු වන වගඋත්තරකාර විදුහල්පති විසින් උක්ත කරුණු සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛන ඉදිරිපත් කරන ලෙස සඳහන් කර ඇත.

මේ අනුව හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් උමැප/හිගු/අධ්‍ය/ගුරු හා 2019-09-09 දිනැති ලිපියෙන් සනාථ කර ඇත. එමෙන්ම පළමු වන සහ දෙවන වගඋත්තරකරුවන් විසින් එකී ලිපිනය පිළිගෙන ලකුණු ලබා දී පෙත්සම්කරුගේ දරුවාගේ නම තාවකාලික ලේඛනයට ඇතුළත් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14. R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் } sechrcsl@gmail.com

පසුව පෙත්සම්කරු වෙත ඉදිරිපත්ව තිබූ විරෝධතාවයක් හේතුකොට ගෙන විරෝධතා හා අභියාචනා මණ්ඩලය වෙත ඉදිරිපත් වී ඇති අතර එහිදී පෙත්සම්කරු විසින් උමදප/හිගු/අධ්‍යා/මැදි/ගුරු 08/පොදු හා 2019-12-02 දිනැති ලිපිය ඉදිරිපත් කරමින් දුෂ්කර සේවා කාලය සනාථ කර ඇත. නමුත් මෙහිදී මණ්ඩලය ප්‍රකාශ කර ඇත්තේ පළමු වන සහ තෙවන වගඋත්තරකරුවන් සඳහා උක්ත ලිපිය නීත්‍යානුකූලව ලැබී නොමැති බවත් එය සනාථ කිරීම අවශ්‍ය වන බවත්ය.

මෙම තත්වය මත පළමු වන වගඋත්තරකාර විදුහල්පති විසින් ලිපියෙහි සත්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා RCG/13/01 – 2020/AP.obj/ED 55 හා 2019.12.05 දිනැති ලිපිය මගින් හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කර ඇත. ඊට පිළිතුරු වශයෙන් අධ්‍යක්ෂවරයා විසින් 2019-12-13 දින ෆැක්ස් පණිවිඩයක් එකී පාසල වෙත යවා ඇත.

නමුත් මෙහිදී මුල් පිටපත පාසල වෙත යැවීමේදී සිදුවූ ප්‍රමාදය හේතුවෙන් එකී පාසල විසින් 2019-12-30 වන දින නිකුත් කරන ලද අවසන් නාම ලේඛනයෙහි පෙත්සම්කරුගේ දරුවාගේ නම සඳහන් නොවීම හේතුවෙන් පෙත්සම්කරුගේ සහ පෙත්සම්කරුගේ දරුවාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බව ප්‍රකාශ කරන පැමිණිලිකරු ඒ සම්බන්ධව වැඩිදුර විමරශනයක් සිදු කර සහනයක් සලසා දෙන ලෙස ඉල්ලා ඇත.

**පළමු වන වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

ගාල්ල. රිච්මන්ඩ් විද්‍යාලයේ එවකට විදුහල්පතිවරයාව සිටි සම්පත් වේරගොඩ මහතා විසින් RCG/13/1-200/2 හා 2020-02-17 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලට අදාලව පහත කරුණු වාර්තා කර ඇත.

අයදුම්කරු වන එම්.කේ.කේ. පෙරේරා විසින් අධ්‍යාපන චක්‍රලේඛනයේ 7.5.2 පරිදි දුෂ්කර සේවය සනාථ කිරීමට 2003-06-27 දින දරණ හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහතික කර ඇති ලිපිය ඉදිරිපත් කර ඇති අතර ඊට සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 12 ක් ලබා දී ඇත.

චක්‍රලේඛනයේ 9.2.8 පරිදි අදාල ලිපියේ සත්‍යතාව පරීක්ෂා කිරීමට පාසල විසින් මෙම ලිපිය හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කර ඇති අතර ඊට පිළිතුරු ලෙස හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ටී.ජී.ඩී.වයි. ගීතාංජලී මිය සිය උමැප/හිගු/අධ්‍යක්ෂ/ගුරු 08/පොදු හා 2019-09-06 දිනැති ලිපියෙන් පො/මැදිරිගිරිය ජාතික පාසල දුෂ්කර හෝ අතිදුෂ්කර පාසලක් නොවන බව දන්වා ඇත.

පසුව පෙත්සම්කාර එම්.කේ.කේ. පෙරේරා මහතා විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත අතින් ගෙනවිත් භාරදී ඇති හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ටී.ජී.ඩී.වයි. ගීතාංජලී මිය විසින් අත්සන් කර ඇති උමැප/හිගු/අධ්‍යා/ගුරු 08/පොදු හා 2019-09-09 ලිපියෙන් ඒ මහතා තම දුෂ්කර සේවා කාලය මත පොලොන්නරුව මැදිරිගිරිය ජාතික පාසලේ සේවය කල බව සහතික කර ඇත. ඒ අනුව ලකුණු 57 ක් පෙත්සම්කරුට ලබාදී තාවකාලික ලේඛනයට දරුවාගේ නම ඇතුලත් කල බව පවසා ඇත.

නමුත් නැවතත් තමන් වෙත (විදුහල්පතිවරයා වෙත) හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලීය පරිපාලන නිලධාරී ඩී.එම්.කේ. මැණිකේ මියගේ අත්සනින් යුතු උමැප/හිගු/අධ්‍යා/ගුරු 08/පොදු හා 2019-09-25 දිනැතිව යොමු කර ඇති ලිපියෙන් පොලොන්නරුව මැදිරිගිරිය ජාතික පාසල දුෂ්කර හෝ අතිදුෂ්කර පාසලක් නොවන බව දන්වා ඇති බව ප්‍රකාශ කර ඇත.

නැවතත් උමැප/හිගු/අධ්‍යා/ගුරු 08/පොදු හා 2019-12-02 දිනැති හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ටී.ජී.ඩී.වයි. ගීතාංජලී මියගේ අත්සනින් යුතු ලිපියෙන් ඒ මහතා පත්වීම් ලබා ඇති කාලයට අනුව දුෂ්කර සේවා කාලයක් සේවය කර ඇති බවද දන්වා ඇත.

මෙහි සත්‍යතාවය හා ගාල්ල රිච්මන්ඩ් විදුහල්පතිවරයා තමාගේ අංක RCG/13/01-2020/AP.Obj/ED 55 හා 2019-12-05 දිනැති ලිපියෙන් හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් විමසන ලද බවත් ඒ අතරතුර පෙත්සම්කරුගේ දරුවාගේ නම තාවකාලික ලේඛනයෙහි දුෂ්කර සේවයට ලකුණු ලබාදී ප්‍රදර්ශණය කල පසු ඊට ලද විරෝධතා දෙක හේතුවෙන් දුෂ්කර සේවයට ලබා දී ඇති ලකුණු 12 අහිමි කරන ලද බවත් ඒ අනුව පෙත්සම්කරුගේ ලකුණු ප්‍රමාණය ලකුණු 45 ක් වූ හෙයින් ස්ථිර ලේඛනයට නම ඇතුලත් නොවූ බවද දක්වා ඇත.

ස්ථිර ලේඛනය ප්‍රදර්ශනය කල පසු 2020-01-02 දින හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ උමැප/හිගු/අධ්‍යා/මැදි/ගුරු 08/පොදු අංක හා 2019-12-02 ලිපියෙන් පෙත්සම්කරු දුෂ්කර සේවා කාලය සම්පූර්ණ කර ඇති බවට සනාථ කල නමුත් ඒ වන විට ස්ථිර ලේඛනය ප්‍රදර්ශනය කර ඇති හෙයින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට හැකියාවක් නොවූ බවත් පෙත්සම්කරුගේ දුෂ්කර සේවය සම්බන්ධව සලකා බැලිය යුත්තේ කවර ලිපියද යන වග කොමිෂන් සභාව විමසුම් කර පෙත්සම්කරුට අසාධාරණයක් වී නම් එය නිවැරදි කිරීම පිළිබඳව සිය විරෝධතාවයක් නොමැති බවද වැඩිදුරටත් දක්වා ඇත.

**පෙත්සම්කරුගේ විරෝධතා :-**

පෙත්සම්කරු කියා සිටින්නේ 2019-09-09 දිනැතිව තමාගේ දුෂ්කර සේවා කාලය සනාථ කල විට තාවකාලික ලේඛනයට තම දරුවාගේ නම ඇතුලත් කල බවයි.

එසේ තිබියදී හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයේ පරිපාලන නිලධාරිණි විසින් 2019-09-25 දිනැතිව පාසලට ලිපියක් එවා ඇත්තේ පාසලේ ඉල්ලීමකට මිස තම ඉල්ලීමකට නොවන බවත් එමගින් 2019-09-09 දිනැති ලිපිය පිළිබඳ නොසලකා හැර ඇති බවත් පවසා ඇත.

නැවත 2019-12-02 දිනැතිව හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් දුෂ්කර සේවය සනාථ කර තිබියදී 2019-12-05 දා පැවති විරෝධතා පරීක්ෂණයට උක්ත 2019-12-02 ලිපිය තමා ඉදිරිපත් කර සිටියදී පළමු වන වගඋත්තරකරු විසින් එම ලිපිය තහවුරු කර ගැනීම සඳහා නැවත අදාල කලාප කාර්යාලයට යොමු කළ යුතු බව තමාට දන්වා දුෂ්කර සේවය සඳහා ලබා දී තිබූ ලකුණු 12 අහිමි කළ බවත් ලිපිය සනාථ කර ගැනීම පෙත්සම්කාර තමාගේ කාර්යයක් නොවන බවත් වගඋත්තරකරුගේ කාර්යයක් බවත්. ඒ අනුව අදාල තහවුරු කිරීම ෆැක්ස් (Fax) මගින් හෝ තැපැල් මගින් හෝ E-mail මගින් යොමු කරන ලෙස විදුහල්පතිවරයා ඉල්ලා සිට ඇති බවත්. ඒ අනුව 2019-12-13 වන දින සවස ඒ ලිපියේ සත්‍යතාව Fax මගින් හෝ තැපැල් මගින් හෝ E-mail මගින් යොමු කරන ලෙස විදුහල්පතිවරයා ඉල්ලා සිට ඇති බවත්. ඒ අනුව 2019-12-13 වන දින සවස ඒ ලිපියේ සත්‍යතාව Fax මගින් විදුහලට දන්වා ඇති නමුත් තම දරුවාගේ නම අවසන් ලේඛනයට ඇතුලත් නොවූ බවත් ප්‍රකාශ කර ඇත.

පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-

පරීක්ෂණයට පෙත්සම්කරුද වගඋත්තරකාර 01, 02 හා 03 පාර්ශවයන් වෙනුවෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම් ඩී.පී. හර්ෂ ප්‍රසන්න මහතා ද සහභාගි වී ඇත.

එහිදී පෙත්සම්කාර එම්.කේ.කේ. පෙරේරා මහතා කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ ගුරු සේවයේ තම මුල් පත්වීම ලැබ 1999 වසරේ සිට 2003-01-02 තෙක් පො/මැදිරිගිරිය ජාතික පාසලෙහි සේවය කරන ලද බවයි.

ඒ අනුව මුල් සම්මුඛ පරීක්ෂණයේදී දුෂ්කර සේවයට අදාල පරීක්ෂණයේදී දැනුවත් වූ කරුණු තහවුරු කිරීම් තමා විසින් විදුහලට ලබා දුන් හෙයින් ඒ අනුව තාවකාලික ලේඛනයට තම දරුවාගේ නම ඇතුලත් කළ බවත් පසුව ලද විරෝධතා හේතුවෙන් ඊට අදාලව නැවත 2019-12-02 දින අදාල තහවුරු කිරීම තමා ලබාදුන් නමුත් උක්ත 2019-12-02 වන දිනැතිව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ ලිපිය තමා විසින් අතේ රැගෙන පැමිණි හෙයින් එය බලරහිත කළ බව අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සභාපති ප්‍රකාශ කර ඒ අනුව දුෂ්කර සේවයට හිමි විය යුතු ලකුණු අහිමි කළ බවත්. ස්ථිර ලේඛනය ප්‍රසිද්ධ කිරීම කරනතුරු තම සේවා කාලයට අදාලව අදාල හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ලිපි 02 ක් නිකුත් කර ඇති බවත් එම නිසා ඉන් පිළිගැනීමට හැක්කේ ආසන්නතම ලිපිය

වන බැවින් එය තහවුරු කර ගැනීම විදුහල්පති ඇතුළු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ වගකීමක් බවත් පවසා ඇත.

**නිරීක්ෂණ :-**

මෙහි පෙත්සම්කාර එම්.කේ.කේ. පෙරේරා යන අය පාසල් වල පළමු වන ශ්‍රේණියට ළමයින් ඇතුලත් කිරීම පිළිබඳ චක්‍රලේඛ අංක 29/20198 හි 7.5 වගන්තිය මගින් දක්වන අධ්‍යාපන අමාත්‍යාංශ යටතේ රජයේ පාසල් අධ්‍යයනයට ඍජුව බලපාන ආයතනික කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ ළමයින් යන ගණය යටතේ 2020 -1 ශ්‍රේණිය සඳහා තම දරුවා ඇතුලත් කිරීමට ඉල්ලුම් පත්‍ර යොමු කර ED 55 යටතේ සම්මුඛ පරීක්ෂණ සඳහා පෙනී සිට ලකුණු 57 ක් ලබා ගෙන ඇත.

පළමු වගඋත්තරකරු විසින් දුෂ්කර සේවය සනාථ කරන ලිපියේ සත්‍යාතාව තහවුරු කර ගැනීමට චක්‍රලේඛණයේ 9.2.8 පරිදි ක්‍රියා කරමින් හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් විමසීම් කර ඇත. ඊට පිළිතුරු ලෙස උමැප/හිගු/අධ්‍යා/මැදි/ගුරු 08/ පොදු හා 2019-09-06 දිනැතිව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා දක්වා ඇත්තේ පොලොන්නරුව මැදිරිගිරිය ජාතික පාසල දුෂ්කර හෝ අතිදුෂ්කර නොවන පාසලක් බවයි.

පසුව පෙත්සම්කරු උමැප/හිගු/අධ්‍යා/මැදි/ගුරු 08 හා 2019-09-09 දිනැති ලිපිය අතින් ගෙනවිත් භාරදී ඇති අතර ඒ තුලින් දුෂ්කර සේවා කාලයක් සේවය කළ බව සනාථ කර ඇති හෙයින් ඊට ලකුණු 12 ක් ලබාදී මුළු ලකුණු 57 ක් ලෙස තාවකාලික ලේඛනයේ දරුවාගේ නම ඇතුලත් කර ඇත.

එසේ නම ඇතුලත්ව තිබියදී නැවත හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයේ පරිපාලන නිලධාරී ඩී.එම්.කේ. මැණිකේ මියගේ අත්සනින් යුතුව උමැප/හිගු/අධ්‍යා/මැදි/ගුරු 08/ පොදු හා 2019-09-25 දිනැති ලිපියෙන් පළමු වගඋත්තරකාර විදුහල්පතිගේ අංක RCG/13/01-2020/AP.Obj/ED 55 හා 2019-09-12 දිනැති ලිපියට පිළිතුරු ලෙස දන්වා ඇත්තේ පොලොන්නරුව මැදිරිගිරිය ජාතික පාසල දුෂ්කර හෝ අති දුෂ්කර පාසලක් නොවන බවයි.

මෙසේ තිබියදී පැමිණිලිකරුගේ දුෂ්කර සේවා කාලය සම්බන්ධව විරෝධතා 02 ක් ලැබී ඇති අතර මෙම විරෝධතා පරීක්ෂණයට පෙත්සම්කරු සිය දුෂ්කර සේවය සනාථ කරමින් හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ටී.ජී.ඩී.වයි. ගීතාංජලී තෙවරප්පෙරුම මිය විසින් නිකුත් කර ඇති උමැප/හිගු/අධ්‍යා/මැදි/ගුරු 08/ පොදු හා 2019-12-02 දිනැති ලිපිය ඉදිරිපත් කරමින් පත්වීම් ලබා ඇති කාලයට අනුව දුෂ්කර සේවා කාලයක් සේවය කර ඇති බව සනාථ කර ඇත.

මෙම ලිපිය සනාථ කර ගැනීම සඳහා පළමු වගඋත්තරකාර විදුහල්පතිවරයා විසින් RCG/13/01-2020/AP.Obj/ED 55 හා 2019-12-05 දිනැති ලිපිය හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කරමින් දක්වා ඇත්තේ තම දුෂ්කර සේවය තහවුරු කිරීම සඳහා මේ සමග ඉදිරිපත් කර ඇති ඔබේ අංක උමැප/හිගු/අධ්‍යා/මැදි/ගුරු 08/ පොදු හා 2019-12-02 දින දරණ හිගුරක්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අත්සන් කරන ලද ලිපිය ඉදිරිපත් කරමි. මෙම ලිපියේ සත්‍යතාවය තහවුරු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙම ලිපිය සඳහා ඉක්මන් පිළිතුරක් බලාපොරොත්තු වන අතර පිළිතුරු විදුහල්පති, රිච්මන්ඩ් විද්‍යාලය, ගාල්ල ලිපිනයට තැපැලෙන් හෝ principal.richmond@mail.com email ලිපිනයට හෝ 0912234886 Fax අංකයට හෝ මා වෙත ලැබීමට සලස්වන මෙන් ............ වශයෙනි.

ඒ අනුව පරීක්ෂණයේදී වගඋත්තර පාර්ශවය වෙනුවෙන් දන්වා සිටියේ අදාල ලිඛිත තහවුරු කිරීම ස්ථිර නාමලේඛන ප්‍රදර්ශණය කළ පසුව 2020-01-02 දින තැපැල් මගින් ලද හෙයින් ස්ථිර නාමලේඛනයට පෙත්සම්කරුගේ දරුවාගේ නම ඇතුළත් කිරීමට හැකියාවක් නොවූනු බවයි.

නමුදු පරීක්ෂණයේදී කොමිෂන් සභාව වෙත අනාවරණය වී ඇත්තේ විදුහල්පතිවරයාගේ උක්ත ලිපියට Fax මගින් අදාල තහවුරු කිරීම 2019-12-13 වන දින ලබා දී ඇති බවයි.

**නිගමනය :-**

මෙම පැමිණිල්ල සම්බන්ධව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු අනුව පැමිණිලිකරුගේ දුෂ්කර සේවය සනාථ කිරීමට අදාලව තැපැල් මගින් 2020-01-02 දින ලද ලිපියේ තහවුරුව Fax මගින් 2019-12-13 දින යොමු කර තිබියදී පෙත්සම්කරු විෂයෙහි දුෂ්කර සේවා කාලය තහවුරු නොවූවා සේ සලකමින් 1 හා 3 යන වගඋත්තරකරුවන් විසින් පෙත්සම්කරු වෙත දක්වන ලද රාජකාරිමය නොසැලකිලිමත්කම හේතුවෙන් පෙත්සම්කරු වෙත දුෂ්කර සේවය සඳහා හිමිවිය යුතු ලකුණු 12 අහිමි කරමින් ඔහු මෙම ගණය යටතේ පාසලට දරුවන් ඇතුළත් කිරීමට ප්‍රමාණවත් ලකුණු නොලද අයදුම්කරුවෙකු ලෙසට සලකා කටයුතු කර ඇත. මේ තුලින් අයදුම්කරු සහ ඔහුගේ දරුවා විෂයෙහි 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 වන ව්‍යවස්ථාව මගින් සහතික කර දී ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිය උල්ලංඝණය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පෙත්සම්කරුගේ දරුවා වන එම්.එල්.ආර්. පෙරේරා දරුවාව ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ ඇතුලත් විය යුතු නියමිත ශ්‍රේණියට ඇතුලත් කිරීමට කටයුතු කළ යුතු බවට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් විදුහල්පති, ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 6 .30 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමි.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

ගරු විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

මා.ගේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත් 01. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

ඉහත නිර්දේශය අනුව කටයුතු කිරීමට

02 අධ්‍යක්ෂ (ජාතික පාසල්),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල

රේ/...